සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය 2021
Second Term Test

| 10 ශ්‍රේණිය | ඉතිහාසය - I | පැය එකයි |
|---|---|---|

**නම / විභාග අංකය :-** ..........................................................................................................

✶ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

✶ 01 සිට 40 තෙක් ප්‍රශ්න වලට (1) , (2) , (3) , (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.

01. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණීතම කෘතිය වන්නේ,
1. බෝධිවංශය 2. දීපවංශය 3. මහාවංශය 4. දාඨාවංශය

02. සිත්නාරුබිම බුදල්නා හට කෘතගුණ දැක්වීමට මහා විජයබාහු රජු විසින් කරවනු ලැබූ මූලාශ්‍රය වූයේ,
1. වල්ලිපුරම් රන් සන්නස
2. ගල්පොත සෙල්ලිපිය
3. පනාකඩුව තඹ සන්නස
4. ගොඩවාය සෙල්ලිපිය

03. පහතින් දැක්වෙන "අ" හා "ආ" තීරු නිවැරදිව ගලපන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| I. | ඇරිස්ටෝටල් | A - | ඉන්ඩිකා |
| II. | ප්ලිනි | B - | භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය |
| III. | ටොලමි | C - | ඩිමුන්ඩෝ |
| IV. | මෙගස්තිනීස් | D - | එදා හෙළදිව |
| | | E - | නැචුරලිස් හිස්ටෝරියා |

1. CEBA 2. CEAB 3. DCAB 4. BCDE

04. තමන් විසින් නොදුටු එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ ලේඛකයෙකු වන්නේ,
1. පාහියන් හිමි 2. ඉබන් බතූතා
3. රිබෙයිරෝ 4. හියුංසියෑං හිමි

05. ප්‍රාග් ඓතිහාසික මානවයා ගල් මෙවලම් සැකසීමට වැඩි වශයෙන් යොදාගත් පාෂාණ වර්ගය වන්නේ,
1. තිරුවානා ගල් 2. කහද ගල් 3. කළු ගල් 4. කබොක් ගල්

06. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කල පහත රට තෙත් කලාපීය ගල් ලෙනක් **නොවූයේ,**
1. පොතාන 2. පාහියන්ගල
3. බටදොඹ ලෙන 4. කිතුල්ගල බෙලිලෙන

07. කිරිදි ඔය හරස් කර අමුණක් බැන්ද වීමට කටයුතු කල රජතුමා වූයේ,
1. මහානාග රජු
2. ඉළනාග රජු
3. කාවන්තිස්ස රජු
4. යටාලතිස්ස රජු

08. ක්‍රි.පූ. 250 දී රචිත සෙල් ලිපියක නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා හඳුන්වා ඇත්තේ,
1. නුරුපුර 2. නකර 3. පුරකමත 4. පරුමක

09. මුල් ඓතිහාසික යුගයේ විවිධ වෘත්තිකයන් විසූ ජනාවාස සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| I. | කේවට්ටගාම | A - | වළං සාදන්නන් විසූ ගම් |
| II. | කාසීකාරගාම | B - | මැණික් ගැරූ හෝ කැපූ අය ජීවත් වූ ගම් |
| III. | මණිකාරගාම | C - | ධීවරයින් විසූ ගම් |
| IV. | කුම්බකාරගාම | D - | වඩුවන් ජීවත් වූ ගම් |
| | | E - | ගොවියන් විසූගම් |

1. ECDA 2. CEAB 3. BADC 4. CEBA

10. තමන්ගේ දසවෙනි රාජ වර්ෂයේ දී දිවයින තුල ග්‍රාමසීමා සටහන් කරන ලද්දේ,

1. ධාතුසේන රජු 2. වසභ රජු 3. පණ්ඩුකාභය රජු 4. වලගම්බා රජු

11. අතීතයේ දී වනවාහිනී නදිය හා ගාල්හ නදිය ලෙස හැඳින් වූ ගංගා දෙක වර්තමානයේ හඳුන්වනු ලබන්නේ,

1. වලවේ ගඟ හා ගල් ඔය 2. මහවැලි ගඟ හා කිරිඳි ඔය
3. ගල් ඔය හා කිරිඳි ඔය 4. වලවේ ගඟ හා මැණික් ගඟ

12. මහාශිලා සුසානයක් පිහිටා **නොතිබූ** ස්ථානයක් වූයේ,

1. යටිගල් පොත්ත 2. රංචාමඩම
3. ඉබ්බන්කටුව 4. ගල් සොහොන්කනත්ත

13. සෙල්ලිපිවල "අවරණ" යන යෙදුමින් හඳුන්වා ඇත්තේ,

1. බිසෝකොටුව 2. සොරොව්ව 3. අමුණ 4. පිටවාන

14. මෙරට දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ නිළධාරීන් "X" තීරුවේ ද අතීතයේ ඔවුන් හැඳින් වූ නම් "Y" තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට අදාල පිළිතුර තෝරන්න.

| | "X" | | "Y" |
|---|---|---|---|
| I. | භෝජනශාලා අධිකාරී | A - | කනපෙඩික |
| II. | සේනාපති | B - | බඩගරික |
| III. | රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී | C - | හතිඅදෙක |
| IV. | ඇත් අංශයේ ප්‍රධානී | D - | බතගු |
| | | E - | ශෙනපති |

1. DBAC 2. DEAC 3. BECD 4. EBAC

15. "කාලිංග චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ" ලෙස තමන් හඳුන්වා ගත්තේ,

1. මහසෙන් රජු 2. කූටකණ්ණ අභය රජු
3. I කාශ්‍යප රජු 4. නිශ්ශංකමල්ල රජු

16. පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට තුඩු දුන් අන්තර්ජාතික වරාය වන්නේ,

1. මහාතිත්ථ 2. ගෝකණ්ණතිත්ථ 3. ගොඩවාය 4. සූකරතිත්ථ

17. පැරණි සෙල්ලිපියක දෙන ලද දීමනාවේ පවිත්‍රත්වය දැක්වෙන සංකේතය වූයේ,

1. අඩ සඳ 2. බල්ලා හා කපුටා 3. හංසයා 4. වටාපත

18. අතීතයේ භික්ෂූන් වහන්සේලාට වාසය කිරීමට පන්, ඉලුක්, ආදී දේ සෙවිලි කොට සාදන ලද වරිච්චි නිවාස හැඳින්වූයේ,

1. ආරාමය 2. අසපුව 3. විහාරස්ථානය 4. පණ්ණසාලා

19. පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ රජතුමා කවුරුන් ද?

- විශාල ප්‍රමාණයේ වැව් ඉදි කරවීම
- බදු අය කිරීම ක්‍රමවත් කිරීම
- රට පළාත්වලට බෙදා පරිපාලනය විධිමත් කිරීම

1. පළමුවන අග්බෝ රජු
2. වසඹ රජු
3. මහසෙන් රජු
4. දුටුගැමුණු රජු

20. ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන මණ්ඩල හෙවත් දසගම් ඇත්තන් පිළිබඳව සඳහන් ව ඇති සෙල්ලිපිය වූයේ,

1. කළුදිය පොකුණ සෙල්ලිපිය
2. ඇඹුල්අඹේ සෙල්ලිපිය
3. වෙහෙරකෙම සෙල්ලිපිය
4. වෙස්සගිරිය සෙල්ලිපිය

21. අතීතයේ නීතිය පිළිබඳ හසල දැනුමක් තිබූ තැනැත්තා හැඳින්වූයේ,

1. වෙජ
2. දුනු අචරිය
3. අස අචරිය
4. වොහාර

22. සීගිරියේ බටහිර ජල උද්‍යානයේ තිබූ සෙල්ලිපියක "අබල වපර" නමින් හඳුන්වා ඇත්තේ,

1. රෙදි වෙළෙන්දෙකි
2. හකුරු වෙළෙන්දෙකි
3. සියඹලා වෙළෙන්දෙකි
4. පැදුරු වෙළෙන්දෙකි

23. පහතින් දැක්වෙන "අ" හා "ආ" තීරු නිවැරදි ව ගලපන්න.

| | "අ" | "ආ" |
|---|---|---|
| I. | ධර්මය මතකයේ තබා ගත් භික්ෂූන් | A - සද්ධිවිහරිය |
| II. | නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩසිටි භික්ෂූන් | B - වසවසික |
| III. | වස්සා වාසික හෙවත් වස් වසන ලද | C - අන්තේවාසික |
| IV. | නායක තෙරුන් වහන්සේ සමීපයේ විසූ ශිෂ්‍ය භික්ෂූන් | D - භාණකවරුන් |

1. ACDB
2. DCBA
3. BCDA
4. CADB

24. අනුරාධපුර පළාතේ ගැමියන් කාලයක් අතහැර දමා යලිත් වගා කිරීම අරඹන හේන් හැඳින්වීමට භාවිතා කර ඇත්තේ,

1. සොහොන්
2. පිටබිම්
3. සේන්
4. කනත්ත

25. ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා විසින් එවන ලද පංච කකුධ භාණඩ භාවිත කොට අභිෂේක උත්සවයක් පැවැත් වූ රජතුමා වූයේ,

1. දේවානම්පියතිත්ස රජු
2. මුටසිව රජු
3. කාවන්තිස්ස රජු
4. අභයනාග රජු

26. වියලි කලාපයේ වැසියන් වැව් පද්ධතියක් හැඳින්වීමට භාවිත කරන ලද්දේ,

1. වැව් පොකුර
2. එල්ලංගාව
3. වැව් ප්‍රපතනය
4. වැව්රැස

27. "පොචනි රජ" යනුවෙන් හැඳින් වූ ප්‍රාදේශීය පාලකයෙකු පිළිබඳ සඳහන් වූයේ,

1. කොක් ඇබේ සෙල්ලිපිය
2. යටහලෙන සෙල්ලිපිය
3. ගොඩවාය සෙල්ලිපිය
4. ඇඹුල් අඹේ සෙල්ලිපිය

28. පහත A,B,C හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් මහාවිජයබාහු රාජ්‍ය සමයේ ජීවත් වූවෙකුට දැනගන්නට **නොලැබෙන** සිදුවීම් ඇතුලත් පිළිතුර කුමක් ද?

A - ඉබන් බතුතා නම් අරාබි දේශාටකයා මෙරටට පැමිණීම
B - අභයගිරි දාගැබ ගොඩනැංවීම
C - හයවන පරාක්‍රමබාහු රජු ලක්දිව එක්සේසත් කිරීම
D - පස්වන මිහිදු රාජ්‍ය සමයේ චෝල ආක්‍රමණයක් එල්ල වීම

1. B හා D
2. A හා B
3. A හා C
4. C හා D

29. පොළොන්නරු යුගයේ දී "ගාවුත කණු" භාවිත කර ඇත්තේ,

1. ඇළ මාර්ග වල දුර දැක්වීමට ය
2. මහා මාර්ග වල දුර දැක්වීමට ය
3. රාජ්‍ය අයිතිය දැක්වීමට ය
4. අභයභූමි වල සීමා දැක්වීමට ය

30. අරාබි ජාතිකයන් ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිත කළ නාමය වූයේ,

1. සෙරන්ඩිබ් ය
2. තම්බපන්නී ය
3. පෙරදිග ධාන්‍යාගාර ය
4. තප්‍රොබේන් ය

31. ගමක සැඟවී සිටින අපරාධකරුවෙකු අල්ලා ගැනීම සඳහා අතීත පාලකයන් යෙදූ උපාය මාර්ගයක් වූයේ,

1. අපරාධකරු පිළිබඳ ඔත්තු සපයන අයට කහවණු ලබා දීම.
2. අපරාධකරු ඇල්ලීම සඳහා චරපුරුෂ සේවාවක් යොදා ගැනීම.
3. අපරාධකරුගේ පවුලේ ඥාතීන් අත් අඩංගුවට ගැනීම.
4. අපරාධකරු අල්ලා ගන්නා තෙක් ඔහු ජීවත් වූ ගමේ වැසියන්ගෙන් බද්දක් අය කිරීම.

32. අතීතයේ දී විවිධ ජාතීන් අතුරෙන් වැඩි පිරිසක් මෙරටට පැමිණ ඇත්තේ,

1. අධ්‍යාපනය ලැබීම සඳහා ය.
2. දේශපාලන බලය ලබා ගැනීමට ය
3. වෙළෙඳාම සඳහා ය
4. සංචාරය සඳහා ය

33. සුවිශේෂී තාක්ෂණික කුසලතාවන්ගෙන් යුතු වූ පැරණිත ම වාරි නිර්මාණයක් ලෙස සංරක්ෂණය කර ඇති සොරොව්ව වන්නේ,

1. මින්නේරිය
2. මාදුරු ඔය
3. නාච්චදූව
4. ගිරිතලේ

34. පහත සඳහන් පැරණි මැනීම් හා ගණනය සම්බන්ධ "X" හා "Y" තීරු නිවැරදි ව ගලපා පිළිතුර තෝරන්න.

| | "X" | | "Y" |
|---|---|---|---|
| I. | දිග දුර | A - | ගුන්ජා |
| II. | අවකාශය | B - | ආංගුලය |
| III. | බර | C - | හවජර |
| IV. | කාලය | D - | අමුණ |
| | | E - | යොදුන |

1. EBDC
2. CEAB
3. BDAC
4. EDAC

35. අතීතයේ කිරිමඩු ශාන්තිකර්මය පවත්වා ඇත්තේ කිනම් සතෙකුගේ ආරක්ෂාව සඳහා ද?
1. මුවා
2. ගෝණා
3. ගවයා
4. ඌරා

36. විශාල බරක් දැරිය හැකි වන සේ ඉදිකල වාස්තු විද්‍යාත්මක නිර්මාණ වලදී නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමයක් අතීතයේ භාවිත කළ බවට සාධක ලැබෙන්නේ,
1. මල්වතු ඔයේ ගල් පාලමේ ය
2. රුවන්වැලි සෑයේ අත්තිවාරමේ ය
3. සීගිරි මහ වැව් බැම්මේ ය
4. අවුකන බුදු පිළිමයේ ය

37. සැලසුම, තාක්ෂණය හා අලංකරණයයන කරුණු අතින් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම නාගරික උද්‍යානය ලෙස හැඳින් වෙන්නේ,
1. සීගිරි උද්‍යානය යි
2. රන්මසු උද්‍යානය යි
3. පදුම උද්‍යානය යි
4. මහමෙව්නා උද්‍යානය යි

38. දියාරු නොවූ අතින් ගෙන අනුභව කල හැකි පදමට සකස් කර ගත් ව්‍යාංජනය හැඳින් වූයේ,
1. ඇඹුල
2. ආනම
3. නියඹලාව
4. කරබේඹිය

39. ශ්‍රී ලංකා ඉතිහාසයේ තෙවරක් ම රාජ්‍ය පාලනය කල රැජිණ වූයේ,
1. චූල සීවලී දේවී රැජිණ
2. ලීලාවතී රැජිණ
3. කල්‍යාණවතී රැජිණ
4. අනුලා රැජිණ

40. ලක්වැසියන් අතර ගෞරවාදරයට පාත්‍ර වූ දුටුගැමුණු රජුගේ මෑණියන් වූයේ,
1. සුගලා දේවි ය
2. සෝමා දේවී ය
3. කරුණා දේවි ය
4. විහාර මහා දේවි ය

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය 2021
Second Term Test

| 10 ශ්‍රේණිය | ඉතිහාසය - II | පැය තුනයි |
|---|---|---|

නම/ විභාග අංකය :- ..............................................................................................................

✶ I කොටසේ පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
✶ II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසේ එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.
✶ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) වලවේ ගඟ, මහනුවර, බුන්දල, මඩකලපුව, රංචාමඩම, කලා වැව, යෝධ වැව, ගෝකණ්ණ තිත්ථ, යාපනය, අනුරාධපුරය, මාතර, මහවැලි ගඟ (ලකුණු 12)

(ii) සුමාත්‍රා, පෘතුගාලය, රතු මුහුද, ජපානය, කැලිකට්, සුබපැතීමේ තුඩුව (ලකුණු 06)

(ආ) i. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික කරුණු වලට සම්බන්ධ පුද්ගලයන් සහ ඓතිහාසික මූලාශ්‍ර අනුපිළිවෙලින් සඳහන් කරන්න.


A - ශ්‍රී ලංකාවේ දිගම සෙල්ලිපිය වන ගල්පොත ශිලා ලිපිය පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද?

B - නූතන මානවයා හඳුන්වන්නේ කිනම් නමකින් ද?

C - අනුරාධපුර නගරය කේන්ද්‍ර කර ගනිමින් රාජධානියක් බිහිකල ප්‍රථම රජතුමා කවුරුන් ද?

D - සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය රැගෙන මෙරටට කිනම් වරායකින් ගොඩබැස්සේ ද? (ලකුණු 04)

ii. 1. A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය හමු වූ ප්‍රදේශය කුමක් ද?
3. මින් කිනම් කර්මාන්තයක ප්‍රගතිය පෙන්නුම් කෙරේ ද?
4. මෙය නිපදවීමට යොදා ගත් උපකරණය කුමක් ද?
(ලකුණු 04)

A


iii. 1. B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය කිනම් ආගමකට අයත්වේ ද?
3. මෙය පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද?
4. මෙය කිනම් ගෘහනිර්මාණ ශිල්පයකට අනුව ඉදි වී තිබේ ද? (ලකුණු 04)

B


## II කොටස

02\. i. පහත සඳහන් කරුණට අදාල පිළිතුර ලියන්න.

A - ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව ලියවී ඇති මූලාශ්‍රය කුමක් ද?

B - පුරාවස්තු විධිමත් ලෙස ආරක්ෂාකර ඇති ආයතනය කුමක් ද?

C - පොළොන්නරු රාජ්‍ය සමයේ භාවිත වී ඇති කාසි වර්ගය කුමක් ද? (ලකුණු 03)

ii. පහත සඳහන් කරුණුවලට අදාල පිළිතුර වරහන තුලින් තෝරා ලියන්න.

(කහාපණ, ගඩලාදෙණිය, ඉසුරුමුණිය, ථූපාරාමය, වසභ, මහා විජයබාහු,
ඇම්බැක්ක, ලක්ෂ්මී කාසි)

A - වල්ලිපුරම් රන්පත් ලේඛනය අයත් වූයේ කිනම් රාජ්‍ය සමයකට ද?

B - අශ්වහිස සහ මිනිසා දැක්වෙන මූර්තිය දැකිය හැකි ස්ථානය කුමක් ද?

C - ශ්‍රී ලංකාවෙන් හමු වූ පැරණිත ම කාසි වර්ගය කුමක් ද?

D - දැව කණුවල විශිෂ්ට කැටයම් දැකිය හැකි ගොඩනැගිල්ල කුමක් ද? (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ පුරාණ නටඹුන් තුලින් පිළිබිඹුවන පැරණි මුතුන්මිත්තන්ගේ හැකියාවන් තුනක් සඳහන්කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. A - වටිනා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විනාශවන අවස්ථා තුනක් ලියන්න.

B - පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ආරක්ෂාකර ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03\. i. අතීතයේ මෙරටින් හමු වී ඇති විදේශීය කාසි අයත් වූ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් කරුණට අදාල කෙටි යෙදුම සඳහන් කරන්න.

A - ගල්ලෙන්වල කටාරම අසල ලියූ ලිපි

B - ගල්තලාවල ලියූ ලිපි

C - සකස් කර ගත් ගල්කුළුණු මත ලියූ ලිපි

D - සකස් කර ගත් ගල් පුවරු මත ලියූ ලිපි (ලකුණු 04)

iii. සාහිත්‍ය මූලාශ්‍ර වල ප්‍රයෝජන තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. ඉතිහාසය හැදෑරීමේ ප්‍රධාන මූලාශ්‍රයක් වන සෙල්ලිපිවල වාර්තා කර තිබූ කරුණු තුනක් සඳහන් කර ඉන් දෙකක් උදාහරණ සහිත ව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

04\. i. ශ්‍රී ලංකාව ජනාවාසවීම හා සම්බන්ධ ප්‍රධාන අවධි තුන නම් කරන්න. (ලකුණු 03)

ii. ගල් යුගට අයත් ප්‍රජාව ජීවත් ව සිටි ප්‍රධාන පරිසර කලාප 04 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. ගල් යුගයේ විසූ මානවයාගේ ආහාර රටාව පිළිබඳ කරුණු 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

iv. ගල් යුගයේ පැවති අභිචාර විධි පිළිබඳ ව සාක්ෂි 03 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

05. i. මහා වංශයේ සඳහන් ව තිබූ වාපිගාම තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් කරුණට අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(රතු දුඹුරු පස, ඔලගම්, හෝටන්තැන්න, රංචා මඩම, උඩරංචා මඩම, පට්ටනගාම, බොරළු පස, පතිරාජවෙල)

A - මැටිඔරු සුසානයක් පිහිටි ප්‍රදේශයකි.

B - කඳුකර එළිමහන් දඩයම් වාසස්ථානයකි.

C - වියළි කලාපයේ කෘෂිකර්මයට උචිත ම පස් වර්ගය

D - අතීතයේ වරාය ආශ්‍රිත ව පිහිටා තිබූ ගම් (ලකුණු 04)

iii. ගමික විසින් ඉටුකල යුතු කාර්යයන් 03 ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ රාජ්‍ය පාලකයෙකු වූ දුටුගැමුණු රජතුමාගේ දේශපාලන හා ආගමික සේවාව විස්තර කරන්න. (ලකුණු 06)

06. i. පහත සඳහන් කරුණට අදාල පිළිතුර ලියන්න.

A - තානාපතිවරයෙකු රෝමයට යවා වීදුරු පබළු ගෙන්වාගෙන රුවන්වැලිසෑයට පූජාවක් පැවැත් වූ රජතුමා කවුරුන් ද?

B - ලොව විශිෂ්ට නිර්මාණයක් ලෙසට සීගිරිය ගොඩනැගූ රජතුමා කවරෙකු ද?

C - ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා කවරෙකු ද? (ලකුණු 03)

ii. පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය

A - පියාගෙන් පුතාට

B - සහෝදරයාගෙන් සහෝදරයාට හිමි වූ බවට උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 04)

iii. රටේ ජනතාවගේ පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටු වීමට කටයුතු කල රජවරුන් තිදෙනෙකු නම් කර ඉන් එක් අයෙකුගේ සේවාව කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)

iv. අතීතයේ මෙරට පැවති දියුණු කර්මාන්ත 03 ක් හඳුන්වා ඉන් 02 ක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06)

07. i. ඕනෑම රටක පාලනය මෙහෙය වන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් කරුණට අදාල කෙටි යෙදුම වරහන් තුළින් තෝරා ලියන්න.

(කැති අඩ, අශ්ව ආචාර්ය, නවදැලි හේන, වෙදහවරු, හස්ති ආචාර්ය, වෙජ, දකපති)

A - ක්‍රි.පූ. දෙවන සියවසේ වෛද්‍යවරුන් මෙලෙස හඳුන්වා ඇත.

B - අලුතින් ගිනි තබා ගත් හේන

C - හේන් වගා කිරීම වෙනුවෙන් අය කල බද්දකි.

D - ඇතුන් හීලෑ කිරීම ඉගැන් වූ ගුරුවරු (ලකුණු 04)

iii. A - අතීතයේ භික්ෂූන් වහන්සේලා වැඩවාසය කල කටාරම් හා සෙල්ලිපි කොටන ලද ගල්ගුහා පිහිටි ප්‍රදේශ තුනක් ද

B - දෙමළ ජනතාවගේ වන්දනාමානයට පාත්‍ර වූ පැරණි හින්දු කෝවිල් දෙකක් ද නම් කරන්න. (ලකුණු 05)

iv. A - ක්‍රි.පූ. එකොළොස්වන සියවසේ සිට දහතුන් වන සියවස දක්වා මෙරට ක්‍රියාත්මක වූ විදේශීය වෙළඳ සංවිධාන තුනක් නම් කරන්න.

B - හතරවන උදය රජු විසින් කරවන ලද සොරබොර වැව ටැම්ලිපියේ සඳහන් වෙළඳ නීති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 06)

## III කොටස

08. i. බෞද්ධ විහාරාරාම වල විසූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයොජනය සඳහා ඉදිකරන ලද පොකුණු තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. මහ වැව් තැනීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

iii. A - වැවක ප්‍රධාන අංග තුනක් නම් කරන්න.
B - ඉහතින් සඳහන් කල එක් අංගයක ප්‍රයෝජනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. A - පුරාණ යකඩ නිස්සාරණ තාක්‍ෂණය පැවති ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න.
B - අතීතයේ විශිෂ්ඨ වාස්තු විද්‍යාත්මක නිර්මාණ තිබූ බව උදාහාරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06)

09. i. අතීතයේ බදු නීතිය යටතේ අයකල ප්‍රධාන බදු වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් A, B, C හා D ට අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(අන්වයාතදාස, මාඝාත නීතිය, සව් කැඳ, යවාගු, කුඩීන්, ගෘහදණ්ඩ, ගොඩවාය, කොන්ඩවට්ටවාන්)

A - රෝගීන් සඳහා සාදන ලද කැඳ වර්ගය

B - වරායකින් අයකර රේගු බදු බෞද්ධ විහාරයකට පූජා කල බව දැක්වෙන සෙල්ලිපිය


C - පැරණි සමාජයේ සාමාන්‍ය ජනතාව හඳුන්වා ඇති යෙදුම

D - කිසිදු සතෙකු නොමැරිය යුතු බවට පැනවූ නීතිය (ලකුණු 04)


iii. අතීත රජවරු පරිසරය ආරක්‍ෂා කර ගැනීමට ක්‍රියාකල අයුරු කරුණු දෙකකින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. අතීතයේ ශ්‍රී ලාංකීය සමාජය තුල කාන්තාවට ගෞරවනීය ස්ථානයක් හිමි වී තිබූ බව කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න.
(ලකුණු 06)

01. ඇ) i



01. ආ) ii



සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය 2021
Second Term Test

10 ශ්‍රේණිය

ඉතිහාසය - පිළිතුරු පත්‍රය

## I - කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **2** | 11 | **1** | 21 | **4** | 31 | **4** |
| 02 | **3** | 12 | **2** | 22 | **3** | 32 | **3** |
| 03 | **1** | 13 | **3** | 23 | **2** | 33 | **2** |
| 04 | **4** | 14 | **2** | 24 | **4** | 34 | **4** |
| 05 | **1** | 15 | **4** | 25 | **1** | 35 | **3** |
| 06 | **1** | 16 | **2** | 26 | **2** | 36 | **2** |
| 07 | **2** | 17 | **3** | 27 | **4** | 37 | **1** |
| 08 | **3** | 18 | **4** | 28 | **3** | 38 | **3** |
| 09 | **4** | 19 | **2** | 29 | **2** | 39 | **2** |
| 10 | **3** | 20 | **1** | 30 | **1** | 40 | **4** |

**(ලකුණු 2 x 40)**

## II - කොටස

01. (අ) (i) සිතියම ලකුණු කිරීම **(ලකුණු 1 x 12)**

(ii) සිතියම ලකුණු කිරීම **(ලකුණු 1 x 6)**

(ආ) (i) A - පොළොන්නරුව B - හොමෝසාපියන්
C - පණ්ඩුකාභය D - දඹකොළ පටුන / ජම්බුකෝලපට්ටන
**(ලකුණු 1 x 4)**

(ii) 1. මැටි බඳුන / වර්ණාලේපිත මැටි බඳුන
2. උඩරංචාමඩම
3. මැටි / කුඹල් කර්මාන්තය
4. සකපෝරුව **(ලකුණු 1 x 4)**

(iii) 1. ශිව දේවාලය
2. හින්දු
3. පොළොන්නරුව
4. චෝල **(ලකුණු 1 x 4)**

02. i. A - මහාවංශය B - කෞතුකාගාරය C - තඹමස්ස **(ලකුණු 1 x 3)**

ii. A - වසභ B - ඉසුරුමුණිය
C - කහාපන / හස්එබුකාසි D - ඇම්බැක්කේ **(ලකුණු 1 x 4)**

iii. - නිර්මාණාත්මක හැකියාව - තාක්ෂණය - ගොඩනැගිලි නිර්මාණය
- ජල පාලනය - පරිසර සංරක්ෂණය ...............................
**(හැකියාවන් තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)**

iv. A - සීග්‍ර නාගරික ජනාවාස ව්‍යාප්තිය / මාර්ග ඉදි කිරීම / ගොඩනැගිලි ඉදිකිරීම / කෘෂිකාර්මික කටයුතු .............................. **(ලකුණු 1 x 3)**

B - විස්තරය අනුව **(ලකුණු 03 න් දෙන්න)**

03. i. රෝමය / චීනය / අරාබිය / ඉන්දියාව .................. **(ලකුණු 1 x 3)**

ii. A - ලෙන් ලිපි B - ගිරි ලිපි
C - ටැම් ලිපි D - පුවරු ලිපි **(ලකුණු 1 x 4)**

iii. - ඓතිහාසික කාල අනුපිළිවෙල සකස් කර ගැනීමට
- එක් එක් අවධි වල දේශපාලන , ආර්ථික , සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට
- එක් මූලාශ්‍රයක් මඟින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මඟින් සනාථ කර ගැනීමට
- රටක විදේශීය සබඳතා අධ්‍යයනය කිරීමට

**(ප්‍රයෝජන තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)**

iv. - භික්ෂූන්ට ලෙන් පිදීම - විහාරාම වලට ගම්බිම් පූජා කිරීම
- බදු අය කිරීම - විහාරම පාලනය කිරීම
- රාජ්‍ය නීති මහජනයාට දැනුම් දීම - වෙළෙඳාම
- පුද්ගලයින්ගේ සේවය ඇගයීම ...................................

**(කරුණු තුනට ලකුණු 03 යි. උදාහරණ සහිත විස්තරයට ලකුණු 03 යි.)**

04. i. ප්‍රාග් ඓතිහාසික / පූර්ව ඓතිහාසික / මුල් ඓතතිහාසික **(ලකුණු 1 x 3)**

ii. අර්ධ ශුෂ්ක කලාපය / පහතරට වියලි කලාපය / පහතරට අතරමැදි වියළි කලාපය / තෙත් කලාපය / ශුෂ්ක කලාපය / කඳුකර අතරමැදි වියළි කලාපය **(ලකුණු 1 x 4)**

iii. - සතුන් දඩයම් කිරීම (නිදසුන් දක්වන්න)
- ශාක ආහාර
- ගොළුබෙල්ලන් / කලපු බෙල්ලන් **(උදාහරණ සහිත විස්තරය අනුව ලකුණු 05 ක් දෙන්න)**

iv. - රාවණා ඇල්ල ගල්ගුහාව / පාහියන්ගල / බටදොඹලෙන යන ස්ථාන වල පැවති අභිචාර විධි සාක්ෂි පැහැදිලි කිරීම **(ලකුණු 06 න් දෙන්න)**

05. i. සුමනවාපිගාම / විහාරවාපිගාම / කඩහවාපිගාම / හුන්දරිවාපිගාම **(ලකුණු 1 x 3)**

ii. A - රංචා මඩම B - හෝටන්තැන්න C - රතු දුඹුරු පස D - පට්ටනගාම
**(ලකුණු 1 x 4)**

iii. - ගමේ පොදු කටයුතු වලට නායකත්වය ලබා දීම
- ගමට අයත් වැව නඩත්තු කිරීම හා ඉන් ජලය බෙදා හැරීම
- ගම්වල පැවති ආරවුල් විසදීම
- ගමේ බදු එකතු කිරීම **(කාර්යයන් 03 ට ලකුණු 03 යි. කෙටි විස්තරයට ලකුණු 02 යි)**

iv. දේශපාලන - සංවිධානාත්මකක සටන් ව්‍යාපාරය
- එළාර පැරදවීම
- භල්ලුක ප්‍රධාන හමුදාව පැරදවීම
- රට එක් සේසත් කිරීම

ආගමික - වෙහෙර විහාර ඉදිකරවීමට උදා:- ..................
- දන්සැල් පැවැත් වීම
- ස්ථූප ඉදිකිරීමේ නිරත පුද්ගලයන්ට වැටුප් ගෙවීම

**(විස්තරයට අනුව ලකුණු 06 න් දෙන්න)**

06\. i. A - භාතිකාභය B - I කාශ්‍යප C - වසභ **(ලකුණු 1 x 3)**

ii. A හා B නිවැරදි උදාහාරණයන්ට **(ලකුණු 2 x 2)**

iii. බුද්ධදාස / I වන උපතිස්ස / VI වන කාශ්‍යප / V වන මහින්ද / දුටුගැමුණු යන ..........
**(රජවරු තිදෙනෙකුට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි)**

iv. යකඩ / තඹ / රන් / ඇත් දත් කැටයම් / මැටි / පේෂ / මැණික් ...................... යන
**(කර්මාන්ත 03 ට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 03 යි)**

07\. i. ව්‍යවස්ථාදායක / විධායක / අධිකරණය **(ලකුණු 1 x 3)**

ii. A - වෙජ B - නවදැලි හේන
C - කැති අඩ D - හස්ති ආචාර්ය **(ලකුණු 1 x 4)**

iii. A - මිහින්තලේ / රිටිගල / වෙස්සගිරිය / සීගිරිය ......................... **(ලකුණු 1 x 3)**

B - තිරුකේතීශ්වරම් / කෝනේෂ්වරම් **(ලකුණු 1 x 2)**

iv. A - නානාදේසී / වලඤ්ජියාර් / අයින්නූරුවර් / කාම්බෝජවරු **(ලකුණු 1 x 3)**

B ★ වෙළෙඳපොළට පැමිණෙන කරත්ත වලින් මිස වෙළෙඳපොල පසුකර ගෙන යන කරත්ත වලින් බදු අය නොකළ යුතු බව
★ පොහොය දිනවල වෙළෙඳාම් කල අයගෙන් දඩ මුදලක් අය කිරීම
★ බුලත් වෙළෙඳාමේ දී හිරු එළියෙන් ආවරණ වන පරිදි මඩුවක් තුළ පමණක් සිදු කිරීම
★ .......................................................... **(ලකුණු 1 x 3)**

**<u>III - කොටස</u>**

08\. i. කුට්ටම්පොකුණ / ඇත් පොකුණ / නෙළුම් පොකුණ / කුමාර පොකුණ **(ලකුණු 1 x 3)**

ii. - කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීමට
- ගංවතුර පාලනය කිරීම
- නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම **(ලකුණු 2 x 2)**

iii. A - වැව් බැම්ම / රළපනාව / සොරොව්ව / බිසෝකොටුව ......................... **(ලකුණු 1 x 3)**
B - **(පැහැදිලි කිරීම් අනුව ලකුණු 2 ක් දෙන්න)**

iv. A - බලංගොඩ සමනළ වැව / සීගිරියට නුදුරු දෙහිගහ ඇල කන්ද **(ලකුණු 1 x 2)**
B - බෞද්ධ ගොඩනැගිලි / ස්ථූප / රාජ මාලිගා / රෝහල් / පිළිම ගෙවල් / විහාර ගෙවල් / ............................ **(විස්තර කිරීමට ලකුණු 4 න් දෙන්න)**


09\. i. දකපති / බෝජකපති / මතරමපිබක **(ලකුණු 1 x 3)**

ii. A - යවාගු B - ගොඩවාය C - කුඩීන් D - මාඝාත නීතිය
**(ලකුණු 1 x 4)**

iii. අනුරාධපුර පුවරු ලිපිය / බුද්ධන්නෙහෙල සෙල්ලිපිය / කොන්ඩවට්ටවාන් ටැම් ලිපිය කේන්ද්‍ර කර ලියන ලද පිළිතුරට **(ලකුණු 05 ක් දෙන්න)**

iv. - රාජ්‍යත්වය දැරීම වැනි වගකීම් ඉසිලීම උදා: ලීලාවතී රැජින
- ප්‍රාදේශීය නායකත්වය දැරීම උදා: පරුමකලු සමනා
- ජනතාව තුල ගෞරවයට පාත්‍ර වීම උදා: විහාර මහා දේවිය
- බෞද්ධ කටයුතුවලට දේපල පුජා කිරීම උදා: තලතා ලක්ෂ්මි
**(කරුණු දෙකක් විස්තර කිරීම අනුව ලකුණු 06 න් දෙන්න)**

01. ආ) i.




01. ආ) ii.

